# ධම්මපදය

## පුප්ඵ වර්ගය (03 ගාථාව)

**3. ගාථාව**

**"ඵේණූපමං කායමිමං විදිත්වා - මරීචිධම්මං අභිසම්බුද්ධානො,**
**ඡෙත්වාන මාරස්ස පපුප්ඵකානි - අදස්සනං මච්චුරාජස්ස ගච්ඡේ"ති.**

**පදාර්ථය**

| | | |
|---|---|---|
| **ඉමං කායං** | - | මේ කය |
| **ඵේණූපමං** | - | පෙණ පිඬක් බඳු යැ'යි |
| **විදිත්වා** | - | දැන |
| **මරීචිධම්මං** | - | මිරිඟුවක් බඳු යැ'යි |
| **අභිසම්බුද්ධානො** | - | සලකනුයේ (සලකන මහණ තෙමේ) |
| **මාරස්ස** | - | මාරයාගේ (කෙලෙස් මාරයාගේ) |
| **පපුප්ඵකානි** | - | ත්‍රෛභූමික වෘත්තයන් නොහොත් පඤ්චකාම ගුණයන් |
| **ඡෙත්වාන** | - | සිඳ |
| **මච්චුරාජස්ස** | - | මාරයා ම |
| **අදස්සනං** | - | නො පෙනෙන හෙවත් විෂය නො වන නිවනට |
| **ගච්ඡේ** | - | යන්නේ ය. |

**භාවාර්ථය**

'මේ කය පෙණ පිඬක් බඳු ය' යි විදර්ශනා ඥානයෙන් දැන එය 'මිරිඟුවක් වැනි ය'යි සලකන මහණ තෙමේ, කෙලෙස් මරහුගේ ත්‍රෛභූමික වෘත්තයන් නොහොත් පඤ්චකාම ගුණයන් සිඳ හැර මරු රජුට විෂය නො වූ නිවනට යන්නේ ය.

**නිදාන කථාව**

සම්මාසම්බුදුරජාණන් වහන්සේ වෙතින් කමටහන් ගෙන මහණදම් පුරන්නෙමි'යි කියා වනයට ගොස් උත්සාහ කොට රහත් බවට පැමිණෙන්නට නො හැකි ව එක්තරා භික්ෂූන් වහන්සේනමක් නැවත ද කමටහන් ලබා ගන්නෙමි'යි සිතා බුදුරජාණන් වහන්සේ වෙත වැඩම කරන්නේ අතරමග දී මිරිඟුවක් දැක 'ග්‍රීෂ්ම කාලයෙහි හටගත් මේ මිරිඟුව ඈත සිටියවුනට රූපවත් එකක් සේ පෙනෙන්නේ වුවත් ළඟ සිටියවුනට එසේ නො පෙනේ. මේ ආත්මභාවය ද ඉපදීමෙන් විනාශවීමෙන් මෙබඳු ස්වභාව ඇත්තෙකැ'යි යනුවෙන් සිතා එම මිරිඟු කමටහන වඩමින් ම ආ සේක.

ඒ අතර ගමන් විඩාව දුරු කරනු පිණිස අචිරවතී ගංගාවට බැස නා ඉන් නැඟී ගං ඉවුරෙහි ගසක් යට ඉන්නේ දිය පහරින් හටගන්නා මහත් වූ පෙණ පිඩු බිඳි බිඳී යනු දැක. 'මේ ආත්මභාවයත් ඉපිද බිඳී යන බැවින් මේ පෙණ පිඩු වැනි ය' යි අරමුණු ගත්හ.

ඒ වේලෙහි බුදුරජාණන් වහන්සේ ගන්ධ කුටියෙහි වැඩ හුන් සේක් මේ තෙරුන් දැක "මහණ, එය එසේ ය. ආත්මභාවයත් පෙණ පිඬක් සේ ද, මිරිඟුවක් සේ ද ඉපදෙන බිඳෙන ස්වභාවය ඇත්තකැ" යි වදාරා **"ඵේණූපමං කායමිමං"** යන ගාථාව වදාළ සේක.

ගාථාව අවසානයෙහි ස්ථවිර තෙමේ පිළිසිඹියාවන් සමග රහත් බවට පැමිණ බුදුරජුන්ගේ රන්වන් සිරුරට ස්තුති කරමින් වැඳ වැඳ ඉදිරියට ආවේ ය.

**ආත්මෝපදේශය:** ආර්යමාර්ග නැමැති නැවට නැඟීමේ උපාය මග විදසුන් මගයි.

සාධු **!** සාධු **!!** සාධු **!!!**

ශ්‍රී සද්ධර්ම සංසදය
ධම්මාරාම යෝගාශ්‍රමය
**(නවම් 2551)**

**<u>සම්පාදක:</u>** පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

**<u>ධර්මදානය:</u>** පින්වත් දයාසීලී උපාසිකා මාතාව විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් උපේක්ෂා පියරංගිකා මෙනෙවිය විසින් දෙමවුපියන්ට ආශීර්වාද පිණිසත් තමන්ට ධර්මාවබෝධය පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ධර්මදේශනා ඇතුළු පටිගත කරන ලද ධර්මදේශනා සහ පසුගිය දහම් ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2007**